සැ.යු.– මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රයේ දෙමළ සහ ඉංග්‍රීසි පිටපත් වෙන වෙනම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1798/13 - 2013 පෙබරවාරි මස 18 වැනි සඳුදා 2013.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2013 පෙබරවාරි මස 06 දිනැති අංක 1796/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙහි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත උපලේඛනය ආදේශ කරමින් එම නිවේදනය මෙයින් සංශෝධනය කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය (අංක 02) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

*(අ)* එහි II වැනි තීරුවෙහි 09, 21 හා 24 වැනි අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන්:-

"9. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
21. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
24. මිලෝදා ආයතනය";

*(ආ)* එහි II වැනි තීරුවෙහි 47 වැනි අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් :-

"48. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව";

(2) එම නිවේදනයෙහි කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය (අංක 22) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදිː-

*(අ)* එහි I වැනි තීරුවෙහි 11සහ 12 වැනි අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ඃ-

"11. 1949 අංක 6 දරන උකස් පනතෙහි 114 වැනි වගන්තිය යටතේ ණය දෙන ආයතන අනුමත කිරීම

12. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්

13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම";

(3) එම නිවේදනයෙහි විදුලිබල හා බලශක්ති අමාත්‍ය (අංක 23) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ඃ-

*(අ)* එහි I වැනි තීරුවෙහි 9 වැනි අයිතමය ඉවත් කිරීමෙන්;

*(ආ)* එහි I වැනි තීරුවෙහි 10 සහ 11 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ඃ-

"9. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්

10. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම";

*(ඇ)* එහි II වැනි තීරුවෙහි 1, 3 සහ 7 අයිතමයන් ඉවත් කිරීමෙන්;

*(ඈ)* එහි II වැනි තීරුවෙහි 2,4,5 සහ 6 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ඃ-

"1. ලංකා විදුලිබල මණ්ඩලය

2. ලංකා විදුලිබල සමාගම

3. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම

4. සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංග් (පුද්ගලික) සමාගම;

*(ඉ)* එහි III වැනි තීරුවෙහි දැක්වෙන "පරමාණුක බලශක්ති අධිකාරිය පනත (1969 අංක 19)" සහ "ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35)" ඉවත් කිරීමෙන්;

(4) එම නිවේදනයෙහි ආර්ථික සංවර්ධන අමාත්‍ය (අංක 26) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදිː-

*(අ)* එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් ඃ-

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා දිළිඳුබව පිටුදැකීම, ගොවිජන සේවා, සංචාරක, සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව (2013 අංක 01 දරන දිවි නැගුම පනතේ විධිවිධාන ක්‍රියාත්මකවීමේ දිනය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට) | ▪ දිවි නැගුම පනත (2013 අංක 1) |
| | 2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ▪ ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46) |
| | 3. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | ▪ සංචාරක පනත (2005 අංක 38) |
| 2. අදාළ ජාතික අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම්කරණ බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම | 4. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | ▪ දිළිඳු සහන පනත (1985 අංක 32) |
| | 5. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | ▪ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත (1995 අංක 30) |
| | | ▪ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත (1996 අංක 18) |
| | | ▪ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනත (2005 අංක 26 ) |

3. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම

4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම

5. ග්‍රාමීය දිවිපෙවෙත වැඩිදියුණු කිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම

6. ග්‍රාමීය සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සහ උපාය මාර්ගයන් සම්පාදනය

7. ග්‍රාමීය සහ වතු අංශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

8. සියලුම ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් (දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් ඇතුළුව) ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම

9. "දිවි නැගුම"ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම (2013 අංක 01 දරන දිවි නැගුම පනතේ විධිවිධාන ක්‍රියාත්මකවීමේ දිනය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට)

10. කුඹුරු භුක්තිය

11. ගොවීන්ගේ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

12. විමධ්‍යගත අරමුදල ක්‍රියාත්මක කිරීම

13. සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරීම

14. සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම

15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්

16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

6. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

7. ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය

8. සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

9. උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

10. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

11. දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා ඊට අයත් පාලිත ආයතන

12. උඩරට සංවර්ධන අධිකාරිය

- දැනට ක්‍රියාත්මකව පවතින, හා වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

(5) එම නිවේදනයෙහි පරිසර අමාත්‍ය (අංක 34) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

*(අ)* එම ශීර්ෂය "(34) පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය"වශයෙන්;

*(ආ)* එහි 1 වැනි තීරුවෙහි 11 වන සහ 12 වන අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් :-

"11. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය
12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම";

*(ඇ)* එහි II වැනි තීරුවෙහි 9 වන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් :-

"10. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය";

*(ඈ)* එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත"යන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් :-

"ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත (2007 අංක 35)"

(6) එම නිවේදනයෙහි අධ්‍යාපන අමාත්‍ය (අංක 37) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි:-

*(අ)* එහි I වැනි තීරුවෙහි 7 සහ 8 අයිතමය ඉවත් කිරීමෙන් ;

*(ආ)* එහි II වැනි තීරුවෙහි 5 වන අයිතමය ඉවත් කිරීමෙන් ;

*(ඇ)* එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩල පනත (1998 අංක 51) "ඉවත් කිරීමෙන් ;

(7) එම නිවේදනයෙහි කෘෂිකර්ම අමාත්‍ය (අංක 43) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි 7 වන අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් :-

"8. සීමාසහිත ලංකා පොහොර සමාගම
9. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
10. ජාතික පොහොර ලේකම් කාර්යාලය
11. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස් ";

*(ආ)* එහි III වැනි තීරුවෙහි "කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)" යන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන්:-

"පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)";

(8) එම නිවේදනයෙහි සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍ය (අංක 50) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

*(අ)* එහි II වැනි තීරුවෙහි 3 වන අයිතමය ඉවත් කිරීමෙන්;

*(ආ)* එහි III වැනි තීරුවෙහි "උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)" ඉවත් කිරීමෙන්;

(9) එම නිවේදනයෙහි ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය (අංක 56) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

*(අ)* එම ශීර්ෂය "(56) වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍ය" වශයෙන්;

*(ආ)* එහි I තීරුවෙහි 5 සහ 6 අයිතමයන් ඉවත් කිරීමෙන්;

*(ඇ)* එහි II වැනි තීරුවෙහි සියලුම අයිතමයන් ඉවත් කර පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන්:–

"1 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
2 වනජීවී භාරය";

(ඈ) එහි III වැනි තීරුවෙහි පහත අයිතමයන් ඉවත් කිරීමෙන් :–

"ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)"
"පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)" ;

(10) එම නිවේදනයෙහි රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය (අංක60) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ː-

*(අ)* එහි II වැනි තීරුවෙහි 2,4,5 සහ 6 අයිතමයන් ඉවත් කිරීමෙන්;

(11) එම නිවේදනයෙහි තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය (අංක 62) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ː-

*(අ)* එම ශීර්ෂය "(62) තාක්ෂණ, පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍ය වශයෙන්;

*(ආ)* එහි II වැනි තීරුවෙහි 11 අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන්ː-
"12. පරමාණුක බලශක්ති අධිකාරිය";

*(ඇ)* එහි II වැනි තීරුවෙහි 14 අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ː-
"15. සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම";

*(ඈ)* එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6)"යන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ː-
"පරමාණුක බලශක්ති අධිකාරිය පනත (1969 අංක 19)";

(12) එම නිවේදනයෙහි ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍ය (අංක 63) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ː-
*(අ)* එහි I වැනි තීරුවෙහි 9 අයිතමය ඉවත් කිරීමෙන්;

(13) එම නිවේදනයෙහි රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍ය (අංක 64) ශීර්ෂයේ I වැනි, II වැනි සහ III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂයන් ඇතුළත් කිරීමෙන් ː-

**(65) සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍ය**

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා සීනි කර්මාන්ත සංවර්ධනයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම

2. අදාළ ජාතික අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම්කරණ බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම

3. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම

4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන*

1. කන්තලේ සීනි සමාගම
2. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම
3. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
4. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
5. උක් පර්යේෂණ ආයතනය

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු පනත්*

- උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75)

- දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලුව්‍යවස්ථාවන්

5. 2011 අංක 43 දරන පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතුකර ඇති සීමාසහිත පැලවත්ත සීනි සමාගමෙහි හා සීමාසහිත සෙවනගල සීනි සමාගමෙහි ඌන උපයෝජිත වත්කම් පුනරුදය සම්බන්ධයෙන් පත්කර ඇති නිසි බලධාරීන් විසින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම

6. II තීරුවෙහි සඳහන් ආයතන වාණිජ වශයෙන් ඵලදායී ව්‍යාපාරයන් බවට පරිවර්තනය කිරීම

7. ව්‍යවසායයන් අධීක්ෂණය, සම්බන්ධීකරණය, මාර්ගෝපදේශ සැපයීම සහ ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වාදීම

8. සීනි කර්මාන්තයට අදාළ රාජ්‍ය සම්පත් කළමනාකරණය හා සුරැකීම

9. ආයතනයන්හි මූල්‍යමය ශක්තිය සහ වාණිජමය ශක්‍යතාව ඉහළ නැංවීම

10. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්

11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

**(66) ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා,ආයෝජන ප්‍රවර්ධනය සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | ▪ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩලය නීතිය) (1978 අංක 4) |
| 2. අදාළ ජාතික අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම්කරණ බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම | | ▪ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (2008 අංක 14) |
| | | ▪ දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

3. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම

4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම

5. විදේශීය ඍජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම

6. පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම

7. 2011 අංක 43 දරන පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතුකර ඇති පහත සඳහන් ආයතනවල ඌන උපයෝජිත වත්කම් පුනරුදය සම්බන්ධයෙන් පත්කර ඇති නිසි බලධාරීන් විසින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම

i. බදුල්ලේ පිහිටි දේපල - කලම්බු කොමර්ෂල් කම්පැණි
ii. සිනෝටෙක්ස් (ලංකා) ලිමිටඩ්
iii. ජැක ලංකා ලිමිටඩ්
iv. ප්ලයිමත් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට් ලිමිටඩ්)
v. කොස්මොස් මැකී ඉන්ඩස්ට්‍රීස්
vi. කාබුල් ලේස් (ප්‍රයිවට් ලිමිටඩ්)
vii. ඉන්ටර්ට්‍රේඩ් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
viii. සීතා පැෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්
ix. ඩී.සී. ඇපරල් ප්‍රයිවට් ලිමිටඩ්
x. නීඩ්ල් ක්‍රාෆ්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
xi. හයි පැෂන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
xii. කොලින්ස් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
xiii. රුහුණු පුතා ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
xiv. සන්ජය ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
xv. මැක්ෆා ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්
xvi. යොහීදා ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
xvii. ඩයනමික් ක්ලෝතින් (ප්‍රයිවට්) ලිමිටඩ්
xviii. 609 පොලිමර්ස් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
xix. කොස්කෝ පොලිමර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
xx. ග්‍රේට් වෝල් ත්‍රෙඩ් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්

xxi. ආදම්ජී එක්ස්ට්‍රැක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
xxii. ඩාටා ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
xxiii. ටෙන්ඩන් ලංකා (ප්‍රයිවට් )ලිමිටඩ්
xxiv. රිකාන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
xxv. කොම්පොසිට් ටවර් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
xxvi. හෙල්ත් ෆුඩ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
xxvii. ශ්‍රී විරාග් ( ප්‍රයිවට්) ලිමිටඩ්
xxviii. රෝයලී එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
xxix. කොන්ටිනෙන්ටල් වනස්පති (ප්‍රයිවට්) ලිමිටඩ්";

8.II තීරුවෙහි දැක්වෙන ආයතනයට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්

9.II තීරුවෙහි දැක්වෙන ආයතනය අධීක්ෂණය කිරීම

**(67) උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන* | *ක්‍රියාත්මක කළයුතු පනත්* |
| 1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා උද්භිද උද්‍යාන සංරක්ෂණය නඩත්තුව හා සංවර්ධනය, පොදු විනෝදාත්මක කටයුතු සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | ■ ජාතික සත්වෝද්‍යාන පනත(1982 අංක 41) |
| 2. අදාළ ජාතික අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම්කරණ බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම | 2. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | ■ උද්භිද උද්‍යාන ආඥාපනත ( 1928 අංක 31) |
| 3. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම | 3. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | ■ දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිත පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
5. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල් වගා කර්මාන්තයට සහායවීම
6. සතුන්, පක්ෂීන් සහ උරගයින් ආදීන් එක් රැස් කර ප්‍රදර්ශනය කිරීම තුළින් මහජනතාවට අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
7. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

**(68) අධ්‍යාපන සේවා අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු පනත්* |
|---|---|---|
| 1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අධ්‍යාපන සේවා සැපයීමට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ව්‍යවස්ථාපිත ආයතනයෙහි විෂයන්ට අදාළව ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම<br>2. අදාළ ජාතික අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම්කරණ බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම<br>3. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම<br>4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම | 1. ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය | ■ ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩල පනත (1998 අංක 51)<br>■ දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිත පවරා නොමැති, මෙහි I හා II තිරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

5. නොමිලේ පෙළ පොත්, නිල ඇඳුම්, පාවහන්, ඩෙස්කු හා පුටු ආදී උපකරණ හා දිවා ආහාර ආදිය ලබාදීමේ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම

6. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය

7. II තීරුවෙහි දැක්වෙන ආයතනයට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්

8. II තීරුවෙහි දැක්වෙන ආයතනය අධීක්ෂණය කිරීම

03-328

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.